www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් පාලනාධිකාරය ඉරානයට එරෙහි යුද්ධය සූදානම් කරයි

## දෙවැනි කොටස

**The Bush administration prepares for war against Iran - Part 2**

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2007 පෙබරවාරි 17**

*2007 ජනවාරි 25-27 දක්වා පැවති ඕස්ට්‍රේලියානු සමාජවාදී සමානතා පක්ෂයේ සාමාජික රැස්වීමට පීටර් සිමන්ඩ්ස් විසින් ඉදිරිපත් කල වාර්තාවේ දෙවැනි කොටස මෙහි පහත පල කෙරේ. ඔහු ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජිකයෙක් හා ඕස්ට්‍රේලියානු සසප මධ්‍යම කාරක සභිකයෙකි.*

මධ්‍යම ආසියාව හා මැදපෙරදිග අතර හරහට පිහිටා ඇති ඉරානයේ ආධිපත්‍ය සඳහා එක්සත් ජනපදය දරන උත්සාහය පිටුපස, පුලුල් මූලෝපායික හේතු සාධක පවතී. එහි උතුරු දේශ සීමාවේ කොකේසස් ප්‍රදේශය -- ආර්මේනියාව හා තෙලින් පොහොසත් අසර්බයිජානය -- මෙන් ම ටර්ක්මනිස්තානය හා කැස්පියන් මුහුද පිහිටා ඇත. ඉරාකය හා ඇෆ්ගනිස්තානය යන එක්සත් ජනපද මිලිටරි ග්‍රහනයට යටත්ව ඇති දෙරට අතර එය පිහිටා ඇත. පර්සියන් ගල්ෆ් හි සමස්ත උතුරු වෙරල සීමාව ම ඉන් පාලනය කෙරේ. එක්සත් ජනපද ආධිපත්‍යයක් යටතේ ඉරානය, ඉරාකය හා ඇෆ්ගනිස්තානය සමඟ බද්ධ වෙමින් මධ්‍යම ආසියාවේ සිට පර්සියන් ගල්ෆ් ප්‍රදේශයට තෙල් හා ගෑස් නල ප්‍රවාහන මාර්ග සඳහා විශාල අවස්ථාවන් විවර කර දෙනු ඇත. එයට පටහැනි ලෙස ඉරානය, රුසියාව හා චීනය වැනි අනෙකුත් බලවතුන් සමග සන්ධාන ගතවුවහොත් කලාපය තුල එක්සත් ජනපද අභිලාෂයන්ට එය බරපතල බාධකයක් බවට පත්වනු ඇත. මධ්‍යම ආසියාව තුල එක්සත් ජනපද බලපෑමට මුහුන දීම සඳහා රුසියාව හා චීනය විසින් ගොඩනගමින් තිබෙන සන්ධානය, එනම් ෂැංහයි සහයෝගිතා සංවිධානයේ (එස්සීඕ) නිරීක්ෂකයෙක් ලෙස ඉරානය ඇතුලත් කර ගැනීම දැනටමත් ඒ දිශාවට සමහර පියවර ගෙන තිබෙන බවට සලකුනකි.

ඉරානයේ මූලෝපායික වැදගත්කම, මහා බලවතුන්ගේ එදිරිවාදිකම්වල ගොදුරක් බවට එය පත්වීමේ කාරනය මගින් සලකුනු කෙරේ. දහනවවැනි සියවසේ දී මධ්‍යම ආසියාවේ හා මැද පෙරදිග ආධිපත්‍යය සඳහා රුසියාව හා බ්‍රිතාන්‍ය අතර සිදු වූ මහා ක්‍රීඩාවේ වැදගත් මූලයක් වූයේ පර්සියාවයි.

ඉරානය, ටිබෙට් හා ඇෆ්ගනිස්තානය තුල ප්‍රධාන බලවතුන් දෙදෙනා අතර ප්‍රශ්න විසඳාගනු ලැබූ 1907 ඇන්ග්ලෝ-රුසියානු මිත්‍රත්වය, ඉරානය අර්ධ දාසයෙකුගේ තත්වයට පිරිහෙලනු ලැබින. උතුර, රුසියානු බලපෑමට යටත් වැයික්කියක් බවට හරවන ලද අතර දකුන, බ්‍රිතාන්‍ය කලාපයක් බවටත් ඉතිරිය මධ්‍යස්ථ කලාපයක් බවටත් පත්විය. 1917 ඔක්තෝබරයේ දී රුසියානු විප්ලවයෙන් පසුව බොල්ෂෙවිකයන් විසින් පමනක් ප්‍රසිද්ධියට පත් කරන ලද ගිවිසුමේ කොන්දේසි පිලිබඳව, ඉරාන පාලන තන්ත්‍රයේ අදහස් විමසීමක් හෝ දැනුම් දීමක් සිදු නොවීය.

ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් පසුව බ්‍රිතාන්‍යය, ඉරානය සිය කොලනියක් බවට ප්‍රායෝගිකව ම පත්කර ගත හැකි ආකාරයේ, රට පුරාම විහිදුනු පාලනයක් ඇති කිරීම සඳහා 1919 ඇන්ග්ලෝ-පර්සියන් ගිවිසුම උපයෝගී කර ගැනීමට උත්සාහ කලේය. ඔක්තෝබර් විප්ලවය මගින් ජනනය කල විරෝධතාවය හමුවේ, දිගට ම බ්‍රිතාන්‍ය හමුදාවන් රඳවා සිටි තෙලින් පොහොසත් දකුනු ඉරානයේ පාලනය සියතෙහි තබා ගෙන ගිවිසුමෙන් ඉවත්වීමට බ්‍රිතාන්‍යයට බල කෙරුනි. බ්‍රිතාන්‍යය වඩ වඩාත් බර දැමුවේ, දහනවවැනි සියවසේ දී රුසියානු පිටුබලය ඇතිව ගොඩනගන ලද ප්‍රභූ පැලැන්තියේ කොසැක් හමුදාංකයේ ප්‍රධානියා වූ රේසා ඛාන්ගේ ආන්ඩුව පිටුපස පෙලගැසීමට ය. ඔහු, 1921දී කුමන්ත්‍රනයකින් බලය අල්ලා ගෙන 1923 අගමැති ලෙස පත්වෙමින් 1925 දී ෂා ලෙස තෙමේ ම ඔටුනු පැලඳි අයෙකි.

ඇන්ග්ලෝ පර්සියන් තෙල් සමාගමේ අධිකාරී ක්‍රියාකලාපය හා වාසිදායක සහන තුලින් බ්‍රිතාන්‍යය, සැලකිය යුතු ලාභ මිරිකා ගනිමින් ඉරානයේ ප්‍රධාන බලය ලෙස ක්‍රියාත්මක විය. බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට හරස් කැපීම සඳහා රේෂා ෂා, සිය ඒකාධිපති පාලනය නීතියුක්ත කිරීමට නාසි දෘෂ්ටිවාදයේ සරන පතමින් වඩ වඩාත් ජර්මනිය වෙත හැරුනි. දෙවැනි ලෝක සංග්‍රාමය ආරම්භයේ දී ආන්ඩුව, ජර්මන් හිතවාදී

ආස්ථානයක් ගනිමින් දේශපාලන හා ආර්ථික පොරොන්දු එයට ගැට ගැසී ය. 1941දී බ්‍රිතාන්‍ය හා සෝවියට් සංගමය, ජර්මානු නිලධරයන් රටින් නෙරපාහල යුතු බවට රේෂා ෂා වෙත අවසන් නිවේදන නිකුත් කලහ. ෂා කරුනු වසං කිරීම හමුවේ බ්‍රිතාන්‍ය හා සෝවියට් හමුදා ඉරානයට ඇතුලු වෙමින් ඔහුට රජකම අතහැර යාමට බල කල අතර උතුරෙහි සෝවියට් කලාපයක් ද දකුනේ බ්‍රිතාන්‍ය කලාපයක් ද වශයෙන් රට කපා වෙන් කර ගත්හ.

කෙසේ වුව ද, යුද්ධය නිමාවීමෙන් පසුව, එක්සත් ජනපදය සිය ආධිපත්‍යය පිහිටුවා ගන්නා ලදී. මොහොමඩ් මොසාඩෙක්ගේ ජාතිකවාදී ආන්ඩුව බලයෙන් පහ කල 1953 කුමන්ත්‍රනය තීරනාත්මක සන්ධිස්ථානයක් සලකුනු කලේය. කුමන්ත්‍රනය පශ්චාත් යුද කාල පරිච්ඡේදයේ සීඅයිඒ සංවිධානයේ එක් කැත මෙහෙයුමක් විය. මොසාඩෙක්ට එල්ල වූ බ්‍රිතාන්‍ය හා ඇමරිකානු විරෝධයේ ලීවරය වූයේ ඇන්ග්ලෝ-පර්සියන් තෙල් සමාගම ජනසතු කිරීමයි. ආන්ඩුව පෙරලා දැමීමේ බ්‍රිතාන්‍ය පියවරයන්ට ඇමරිකාව සහාය දැක් වූ නමුත් මොසාඩෙක්ගේ වැටීමත් සමග ම ඇමරිකානු බලපෑම හා එහි තෙල් සමාගම්වල ආධිපත්‍ය සහතික කර ගත්හ. ස්විට්සර්ලන්තයේ අධ්‍යාපනය ලැබූ රේසා ඛාන්ගේ පුත්‍රයා ෂා ලෙස පත්කර ගත් අතර එක්සත් ජනපදයේ සහාය ලැබූ ඔහු සියලු විරුද්ධත්වයන් මඩිමින් දශක තුනකට ආසන්න කාලයක් බලයේ රැඳී සිටියේය.

සීතල යුද්ධය අවධියේ දී ඉරානය, එක්සත් ජනපදයේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් විය. ෂාගේ මදාවිකාර එස්ඒවීඒකේ (සැවැක්) නම් රහස් පොලිසිය පුහුනු කල සීඅයිඒ සංවිධානය, ඉරාන දේශපාලන කටයුතුවලට බෙහෙවින් මැදිහත් විය. එක්සත් ජනපද මිලිටරි සැලසුම් යටතේ පුහුනුවීම් හා තාක්ෂනික ආධාර සැපයුනි. 1950 ත් 1977 අතර විදේශ ආන්ඩු මගින් කල මිලිටරි ආම්පන්න ඇනවුම්වලින් සියයට 25ක් නැතහොත් ඩොලර් බිලියන 18 කට ම වගකිවූ ඉරානය, ඇමරිකාවේ ප්‍රධාන ආයුධ ගැනුම්කරුවා විය, ඒ සඳහා ෂා, රටේ තෙල් ආදායම යොදා ගත්තේය. අති නවීන ආයුධ භාවිතා කිරීමට සහාය වීම පිනිස ඇමරිකානු තාක්ෂන ශිල්පීන්ගේ කුඩා හමුදාවක් ම රට තුල රැඳී සිටියහ. ෂා ඇදවැටීමට පෙර කාලයේ දී, මිලිටරි වැඩ සටහන්වලට අදාල කටයුතු සඳහා 6400ක සිවිල් කොන්ත්‍රාත්කරුවන් හා 1200 ක ආන්ඩුවේ නියෝජිතයන් ඉරානයේ රැඳී සිටියහ.

1979 ෂාගේ වැටීමෙන් පසුව ද එක්සත් ජනපදය සිය බලපෑම අහිමිවීමේ තත්වය කිසිවිටෙක පිලිගත්තේ නැත. ටෙහෙරානයේ එක්සත් ජනපද තානාපති කාර්යාලය අල්ලා ගත් තැන් පටන් ඇමරිකාව, තානාපති සබඳකම් යලි පිහිටුවා ගත්තේ නැති අතර, දශක දෙක හමාරකට වැඩි කාලයක් ආර්ථික සම්බාධකවලට සමාන තත්වයන් ඉරානයට එරෙහිව පවත්වාගෙන ගියේය. ලක්ෂ ගනනකගේ ජීවිතවල වියදමින්, ඉරානයේ නව පාලන තන්ත්‍රයට වල කැපීම සඳහා 1980 ගනන්වල ලේවැකි යුද්ධයේ දී එක්සත් ජනපදය මෙන්ම අනෙකුත් බලවතුන් ද ඉරාකයට සහාය දැක්වූහ. කෙසේ වූව ද එතැන් පටන්, චීනය, රුසියාව හා යුරෝපීය බලවතුන් හිඩැස පුරවන ආකාරය එක්සත් ජනපදය බලා සිටියේය. 1997 දී ඉරානයේ ඊනියා ප්‍රතිසංස්කරනවාදී ජනාධිපති ලෙස මොහොමඩ් කටාමි පත්වීමෙන් පසුව එය විශේෂිත විය. ඉරානය සමග කෙරීගෙන යන එක්සත් ජනපදයේ අරගලය, ඇමරිකාවේ යුරෝපීය හා ආසියානු ප්‍රතිවාදීන් විසින් අත්කර ගෙන තිබෙන ආර්ථික හා මූලෝපායික වාසි කපා හැරීමේ නිශ්චිත අරමුනු සහිතව කෙරී ගෙන යයි.

## මැද පෙරදිග ප්‍රතිසංවිධානය

ඊනියා නව සංස්ථිතිකවාදීන් විසින් වඩාත් තියුනු ලෙස ගෙන හැර දක්වා ඇති බුෂ් පරිපාලනයේ මූලෝපායට යටින් දිවෙන තර්කනය සැලකිල්ලට ගැනීම වටියි. දශකයකටත් පෙර 1996 දී, රිචඩ් පර්ලේ හා ඩග්ලස් ෆේත් ද ඇතුලත් නව සංස්ථිතිකවාදීන් කන්ඩායමක් ඊස්රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු වෙනුවෙන් සකස් කල "පැහැදිලි වෙනසක්: විෂය පථය රැක ගැනීමේ නව මූලෝපායක්" යන නමින් යුත් ලියවිල්ලකින් නිර්දේශ කලේ මැද පෙරදිග සාම ක්‍රියාවලියෙන් මුලුමනින්ම බිඳී වෙන්වීමක් හා සිරියාව හා ඉරාකය ද ඇතුලත් "වඩාත්ම අනතුරුදායක තරජනයන් ආපසු කැරකවීම හා විසුරුවා හැරීම අඩංගු කර ගත්" නව මූලෝපායක අවශ්‍යතාවයයි.

බුෂ් පාලනාධිකාරය තුල දැරූ අධිකාරවත් තනතුරු යොදා ගනිමින් නව සංස්ථිතිකවාදීහූ සැප්තැම්බර් 11 ත්‍රස්තවාදී ප්‍රහාරයන් උපයෝගී කර ගනිමින් මැදපෙරදිග පරිවර්තනය කිරීමේ සිය සැලසුම් ක්‍රියාත්මක කිරීමට යුහුසුලු වූහ. යාන්තම් දින 9ක් ඉක්මගිය තැන විලියම් ක්‍රිස්ටල්ගේ නායකත්වයෙන් යුත් ප්‍රමුඛ නව සංස්ථිතිකවාදීන් කන්ඩායමක් ජනාධිපති වෙත යොමු කල ප්‍රසිද්ධ ලිපියකින් අවධාරනය කලේ බින්ලාඩන් අල්ලා ගැනීම හෝ මරා දැමීම "කිසි ලෙසකින් හෝ එකම ඉලක්කය නොවිය යුතු" බවයි.

සැප්තැම්බර් 11ට කිසිදු සම්බන්ධයක් නොතිබුනේ වී නමුත් ලිපිය සුවිශේෂිතව ඉලක්ක කලේ ඉරාකයයි. "ප්‍රහාරයට ඉරාකය සෘජු ලෙස සම්බන්ධ කරන සාක්ෂි නො තිබුන ද ත්‍රස්තවාදය හා එහි අනුග්‍රාහකයන් මුලිනුපුටා දැමීම අරමුනු කොට ගත් ඕනෑ ම

මූලෝපායක්, ඉරාකය තුල සදාම් හුසේන් බලයෙන් පහකිරීමේ අධිෂ්ඨානශීලී උත්සාහයක් ගැබ්කර ගත යුතුය"යි එය කියා සිටියේය.

හෙස්බුල්ලා සංවිධානයට සහාය දීම නතර කරන ලෙස ඉරානයට හා සිරියාවට අවසන් නිවේදනය නිකුත් කල යුතු බවට ද ලිපියෙන් උපදෙස් දී ඇත. ''ඉරානය හා සිරියාව එය පිලිනොගත්තේ නම්, මෙම හඳුනාගත් ත්‍රස්තවාදී රාජ්‍යයන්ට එරෙහිව ප්‍රතිප්‍රහාර දීමේ නිශ්චිත පියවරයන් කෙරෙහි පරිපාලනයේ අවධානය යොමු විය යුතුය''යි එහි සඳහන් ය. වෙනත් වචනවලින් කිවහොත් එක්සත් ජනපද අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මැදපෙරදිග යලි සැකසීමේ අරමුන, ඊනියා ත්‍රස්ත විරෝධී යුද්ධය ආරම්භයේ පටන්ම පැවති බවයි.

ඉරාකය ව්‍යසනයක් බවට පත්වීමේ තතු තුල, යුද්ධයට පිටුබලය සැපයීමේදී ඒකරාශී වූ එක්සත් ජනපද දේශපාලන සංස්ථාපිතය තුල, බෙදීම් මතුවීමට පටන්ගෙන තිබේ. තමන් දකින ආකාරයට ලඟ එන ව්‍යසනයක් වලක්වා ගනිමින් එක්සත් ජනපද ආසක්තයන්ට රුකුලක් වන පරිදි මැද පෙරදිග තුල යථාර්ථවත් දේශපාලනයට යලි පිවිසිය යුතුයයි උපදෙස් දෙන, එක්සත් ජනපද පාලක කවයන් තුල සිටින බුෂ් පරිපාලනයේ විවේචකයන් ඉදිරිපත් කරන විකල්පය සලකා බැලීම වටී.

විදේශ කටයුතු කමිටුවේ වර්තමාන සභාපති හා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ හිටපු ඉහල නිලධාරියෙකු වන රිචඩ් හාර්ස් විසින් "නව මැදපෙරදිග" යන මාතෘකාව යටතේ ෆොරීන් එෆෙයාර්ස් සඟරාවේ නොවැම්බර්/දෙසැම්බර් කලාපයෙහි, පලකල ලිපියක මෙම තර්කනය යම් දුරකට දැක ගත හැකිය.

මැදපෙරදිග ඉතිහාසය අවධීන් පහකට බෙදන හාර්ස් එහි පුලුල් චිත්‍රයක් නිර්මානය කරයි. 1. නැපෝලියන්ගේ ඊජිප්තු ආගමනයෙන් ආරම්භ වී පලමු ලෝක සංග්‍රාමයෙන් පසුව ඔටෝමන් අධිරාජ්‍ය බිඳ වැටීමත් සමග අවසන් වන යටත් විජිත අවධිය. 2. 1956 සූවස් අර්බුදයෙන් අවසන් වූ යුරෝපීය ජයග්‍රාහකයන් විසින් කලාපය බෙදා ගත් අවධිය. 3. සීතල යුද්ධයේ අවධිය. 4. පශ්චාත් සීතල යුද්ධ අවධිය. "පෙර නොවූවිරූ බලපෑමක් ද කටයුතු කිරීමේ නිදහසක් ද එක්සත් ජනපදය භුක්තිවින්දේ" මෙම වකවානුවෙහි යයි හාර්ස් සඳහන් කරයි.

හාර්ස්ට අනුව, එක්සත් ජනපදයේ ආධිපත්‍ය පැවති එම අවධිය දැන් අවසාන වී ඇත . මෙය ගැස්සීයාමට එක් හේතුවක් වූයේ ඉරාක ආක්‍රමනයයි. "අවශ්‍යව තිබූ යුද්ධයක් වන ප්‍රථම ඉරාක යුද්ධය මැදපෙරදිග තුල ඇමරිකානු යුගයක ආරම්භය සලකුනු කල අතර, තෝරා ගත් යුද්ධයක් වූ දෙවන ඉරාක යුද්ධය එහි අවසානය ඉක්මන් කිරීම ඓතිහාසික විරෝධාභාසයකැයි" ඔහු ලියා ඇත. හාර්ස් ගෙනහැර දක්වන පරිදි, පස්වන අවධියේ සලකුනු ඇමරිකානු අධිරාජ්‍යවාදයට සුභදායක නැත. කලාපය තුල එක්සත් ජනපදයේ බලපෑම පිරිහෙමින් තිබිය දී, යුරෝපීය සංගමය, රුසියාව, චීනය හා අනෙකුත් පිටස්තරයන් විසින් එල්ල කරන අභියෝගය වැඩි වෙමින් තිබෙන බව ඔහු පෙන්වා දෙයි. තත්වය පිලිබඳව ඔහුගේ පිලිතුරෙහි ප්‍රමාද දෝෂයන් දෙකක් වලක්වා ගැනීම සඳහා අවස්ථාවන් දෙකක් අල්ලා ගත යුතු යයි අවසාන වශයෙන් ඔහු කියා සිටියි. නැගී එන ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි බලාපොරොත්තු රැඳවීම හා මිලිටරි බලය මත ඕනෑවට වඩා රඳා පැවැත්ම එම වැරදි දෙකයි. " ලෙබනනයේ දී ඊස්රායලය මෙන්ම ඉරාකයේ දී දැවැන්ත වියදමකින් එක්සත් ජනපදය ඉගෙන ගෙන ඇති පාඩම නම් මිලිටරි බලය සර්ව රෝග නිවාරකයක් නොවන බවය.''

ප්‍රථම කොට, මිලිටරිමය නොවන අවි විශාල වශයෙන් යොදා ගැනීමත් දෙවනුව, මැදපෙරදිග තෙල් මත එක්සත් ජනපදයේ රඳා පැවැත්ම මකා දැමීමත්, අල්ලා ගත යුතු අවස්ථවන් දෙක බව ඔහු කියා සිටියි.

ඉරානය සම්බන්ධයෙන් ඔහු කියන්නේ "ඉරාන න්‍යෂ්ටික වැඩ පිලිවෙලත්, ත්‍රස්තවාදයට හා විදේශ සටන්කරුවන්ට දෙන සහයෝගයත් මුල් කොටගෙන පූර්ව කොන්දේසිවලින් තොර පුලුල් සාකච්ඡාවක් එක්සත් ජනපද ආන්ඩුව විසින් ආරම්භ කල යුතුය. ආර්ථික දේශපාලනික හා ආරක්ෂක දිරි ගැන්වීම් මාලාවක් ඉරානයට පිලිගැන්විය යුතු" බවයි. ඉරානය සමග එලඹිය යුතු එවන් ගිවිසුමක් සඳහා වූ යෝජනාවක් තරමක් විස්තර සහිතව ඔහු ඉදිරිපත් කරයි.

මෙම යෝජනාව නොපිලිගැනෙන්නේ මන්ද යන පැහැදිලි ප්‍රශ්නය නැඟිය යුතුය. ඉරාක අධ්‍යයන කන්ඩායමේ වාර්තාවෙන් ද ඉරානය හා සිරියාව සමඟ සාකච්ඡාවන් ද ඇතුලත් මැදපෙරදිග සඳහා සවිස්තරාත්මක රාජ්‍යතාන්ත්‍රික මූලෝපායක් ඉදිරිපත් කෙරුනි. බුෂ් පාලනාධිකාරය එම යෝජනා ඉවත දැමුවා පමනක් නොව එයට සපුරාම වෙනස් දෙයක් ක්‍රියාවට නඟමින් සිටියි. එම පාර්ශවයේ හුදු හිතුවක්කාරකම හෝ පිස්සුව නිසා නොවේ. 1970 ගනන් හා 80 ගනන්වලට සහේතුක වූ ඇමරිකානු විදේශ පිලිවෙත, ඇමරිකානු පාලක පන්තියේ අවශ්‍යතාවන්ට තවදුරටත් ගැලපෙන්නේ නැත.

හාර්ස් සිය ''පස්වෙනි අවධිය'' පිලිබඳ සාකච්ඡාවේ දී මැදපෙරදිග තුල ඇමරිකානු අධිකාරය වියැකී යාම, එහි ගෝලීය ආධිපත්‍යය පිරිහී යෑම

පිලිගැනීමකට සමාන වන බව පෙන්වා දීමට උත්සාහ කරයි. එබැවින් සරලවම එය එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට පිලිගත හැකි විකල්පයක් නොවේ.

ඉරාකය පිලිබඳ ප්‍රශ්නයේ දී මෙන්ම ඉරානය සමග ගනුදෙනුවේ දී ද, මිලිටරිමය නොවන රාජ්‍යතාන්ත්‍රික මූලෝපායක්, මැදපෙරදිග සමීකරනයේ ප්‍රධාන මූලයක් වන ආර්ථිකව හා දේශපාලනිකව එක්සත් ජනපදය පසෙකට තල්ලුවී යෑම නොවැලැක්විය හැකිය. ඉරානය තුල ආර්ථික ආයෝජනයන් මුලුමනින්ම පාහේ නැති වී ගිය තතු තුල, එක්සත් ජනපදයට එහි කිසිදු දේශපාලන අධිකාරයක් නොමැති අතර, එහි එදිරිවාදීන් සැලකිය යුතු අධිකාරයක් ගොඩනගා ගෙන තිබේ. එය කෙටියෙන් සලකා බලමු.

**යුරෝපය**:- 1990 ගනන් මැදභාගයේ ඉරානය සමග සබඳතා යලි ආරම්භ කිරීමෙන් පසුව යුරෝපීය සංගමය, ඉරානයේ මුලු වෙලඳපොලෙන් සියයට 35 ක පංගුවක් හිමි කර ගන්නා අතර එය ජපානයේ සියයට 12.3 ද චීනයේ සියයට 9.1 ද ඉක්මවා ඇත. යුරෝපා සංගමයෙන් ඉරානයට කෙරෙන අපනයනයන් 1999 සිට දෙගුනයකින් ඉහල ගොස් තිබේ.

**ජපානය**:- ජපානයේ තෙවන විශාලතම තෙල් අපනයනකරුවා වන ඉරානය එහි තෙල් අවශ්‍යතාවන්ගෙන් සියයට 15.9 පමනම පිරිමසාලයි. මැදපෙරදිග විශාලතම තෙල් බිමක් වන දැවැන්ත අසෙඩිගාන් තෙල් බිමෙහි සංවර්ධන කටයුතුවලින් සියයට 75 ක්ම හිමි කර ගත් ප්‍රධාන ගිවිසුමක් 2004 පෙබරවාරියේ දී ජපානයේ ඉන්පෙක්ස් කෝපරේෂන් නම් සමාගම ටෙහෙරානයේ දී අත්සන් තැබීය. වොෂින්ටනයේ දැඩි බලපෑම් හමුවේ එම කොටස දැන් සියයට 10කට තරම් කැපී ගොස් තබේ.

**චීනය**:- සෞදි අරාබියට පසු චීනයේ දෙවැනි සැපයුම්කරුවා වන ඉරානය චීන තෙල් ආනයනයෙන් සියයට 14 පමන සපුරාලයි. ඉරානයේ ස්වභාවික දියර ගෑස් (එල්එන්ජී) මිලට ගැනීමේ විසිපස් අවුරුදු කොන්ත්‍රාත්තුවකට හිලව් වශයෙන් ඉරානයේ යාඩවාන් තෙල් බිම සංවර්ධනය කිරීමේ ඩොලර් බිලියන 70ක ගිවිසුමක් එහි රජය සතු සිනොපෙක් ග්‍රෑප් සමාගම විසින් අත්සන් තබා ඇත. බීජිනය සිය ආයෝජනයන් කපා හැරීමට කෙරෙන එක්සත් ජනපදයේ බලපෑම නොතකා හරිමින් සිටියි.

**රුසියාව**:- මොස්කෝව, ඉරානය සමග බෙහෙවින් ලාභදායී ආර්ථික සබඳතාවන් පවත්වා ගෙන යයි. නිමකිරීමට ආසන්නව ඇති බුෂෙර් හි ප්‍රථම ඉරාන න්‍යෂ්ටික බලාගාරයේ ඉදිකිරීම සඳහා රුසියානු සමාගම් දස දහස් ගනන් මිනිසුන් සේවයේ යොදවා ඇත. ව්‍යාපෘතිය ඩොලර් බිලියනයක් ලෙස තක්සේරු කර ඇති අතර අනාගත බලාගාර සඳහා තවත් බිලියන 5ක ගිවිසුම් අත්සන් තැබීමට නියමිතය.

**ඉන්දියාව හා පකිස්ථානය**:- ඉරානයේ සිට පකිස්ථානය හරහා ඉන්දියාවට දිවෙන බිලියන 7ක වටිනා ගෑස් නල ඉදිකිරීමේ ගිවිසුමක් ටෙහෙරානය සමග නවදිල්ලිය හා ඉස්ලාමාබාදය විසින් අත්සන් තබා ඇත. ගිවිසුම ඉරාදමන ලෙසට වොෂින්ටනයෙන් කෙරෙන බලපෑමට දෙරටම මුහුන දී සිටියි.

ඉරානය සමග ගැටුම අවසන් කෙරෙන ඕනෑ ම තත්වයක ප්‍රතිඵලය වනු ඇත්තේ මෙම සැලසුම් කඩිනම් වී එක්සත් ජනපදයට අවාසියක් සිදුවීම ය. සිය පස මිතුරන් පිටු දැකීමේ ආර්ථික ප්‍රහාරය හැරෙන්නට එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් සතු එකම විකල්පය මිලිටරි බලයයි. ඉරානයටත් සමස්තයක් ලෙස මුලු මැදපෙරදිගටමත් එරෙහිව එල්ල කෙරෙන බුෂ් පාලනාධිකාරයේ පැතිර යන මිලිටරි තර්ජනය පිටුපස පවතින්නේ මෙයයි. ඉරානයට එරෙහි ඕනෑ ම යුද්ධයක්, අනෙකුත් මහා බලවතුන් සිය ආසක්තයන් රැක ගැනීමේ එකම ක්‍රමය යුද්ධය ය යන නිගමනය කරා ඒමෙන් වඩාත් පුලුල් යුද ගිනි ජාලාවක් ඇවිලී යෑමේ විභවය ගැබ්කර ගනී.

මිලිටරිවාදයේ පැන නැගීමට තමන්ගේම පිලිතුරක් කම්කරු පන්තිය සතු විය යුතුය. ඔටෝමන් අධිරාජ්‍යයේ බිඳ වැටීම හා ප්‍රථම ලෝක සංග්‍රාමය ආරම්භයේ දී බ්‍රිතාන්‍ය හා ප්‍රන්ස අධිරාජ්‍යවාදීන් විසින් මැදපෙරදිග කපා පිහිට වූ රාජ්‍යයන් මුලුමනින් ම කෘතිම ඒවාය. එක්සත් ජනපදය දැන් මාන බලන්නේ කලාපය සිය අවශ්‍යතාවන්ට ඔබින පරිදි යලි සැකසීමටය. කම්කරු පන්තිය තමන්ගේම සැලසුමක් සහිතව මෙයට පිලිතුරු දිය යුතුය. එනම්, සමාජවාදය සඳහා පුලුල් ජාත්‍යන්තර අරගලයක කොටසක් ලෙස මැදපෙරදිග එක්සත් සමාජවාදී රාජ්‍යයන් සඳහා අරගලයකිනි.

එබැවින්, 2007 ජනවාරි 22 දින ලෝක සමාජවාදී වෙබ් අඩවිය යුද විරෝධී ව්‍යාපාරයේ පුනර්ජීවනයක් කැඳවුම් කරමින් නිකුත් කල ප්‍රකාශනය තීරනාත්මකය. ලෝකය පුරාම වැඩ කරන ජනතාවන් විසින් ප්‍රතිප්‍රහාරය සඳහා යොමු විය යුතු අත්‍යාවශ්‍ය දේශපාලන ක්‍රියාමාර්ගය එමගින් සම්පාදනය කෙරේ.

"මැදපෙරදිග වැඩ කරන ජනතාව, දැනටමත් ඉරාකය තුල නිකායවාදි රුධිර ස්නානයක් නිර්මානය කොට මුලු කලාපයම සට්ටනයකට ඇදලීමට තර්ජනය කරන්නා වූ ජනවාර්ගික හා ආගමික මතභේද අවුලුවාලීම ප්‍රතික්ෂේප කල යුතුය. අධිරාජ්‍යවාදී ආක්‍රමනයට හා මුස්ලිම් විරෝධී වර්ගවාදයට පිලිතුරු

වන්නේ පාලක පැලැන්තියේ ඒ හෝ මේ කොටසට අනිවාර්ය ලෙසම සේවය කරන්නා වූ ඉස්ලාමීය මූලධර්මවාදය කරා පසුබැසීම නොවේ. කල යුතුව ඇත්තේ මැදපෙරදිග වැඩ කරන ජනතාව ලෝකය පුරා තම පන්ති සහෝදර සහෝදරියන් සමග සමාජවාදී ජාත්‍යන්තරවාදයේ පදනම මත ඒකාබද්ධ කිරීමය".

බුෂ් පරිපාලනයේ යුද්ධ මගින් නිර්මානය කල සංක්ෂෝභයෙන් ඉවතට මගක් සොයා ගැනීමට උත්සාහ කරන මැදපෙරදිග ජනතාවන් අතර එම ආයාචනය කෙරෙහි ප්‍රතිචාරයක් නොවරදවාම ජනිත කරනු ඇත.

**සමාප්තයි.**

© www.wsws.org